# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

**10 ශ්‍රේණිය**

## නාට්‍යය හා රංග කලාව - II

නම/ විභාග අංකය: ....................................... කාලය පැය 2යි

**පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01) දික්තල කාලගෝල නාට්‍ය පෙළ ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. දික්තල කාලගෝල නාට්‍යයේ පෙළ රචකයා කවුරුන්ද?
ii. මෙම නාට්‍යයේ පෙළ රචනා කිරීම සඳහා පදනම් වූ මූල බීජය කුමක්ද?
iii. මෙම නාට්‍ය නිර්මාණය සඳහා පාදක කර ගත් දේශීය රංග ශෛලිය කුමක්ද?
iv. එම දේශීය රංග ශෛලියේ ලක්ෂණ පෙන්නුම් කෙරෙන අවස්ථාවක් සඳහන් කරන්න.
v. මෙම නාට්‍යයේ ප්‍රධාන ගැටුම කුමක්ද?
vi. එම ගැටුම විසඳෙන්නේ කෙසේද?

(ලකුණු 2x6=12)

02)
i. ශිථිලකරණ අභ්‍යාස යනු මොනවාද?
ii. ඔබ පාසලේ දී සිදුකළ එක් ශිථිලකරණ අභ්‍යාසයක් විස්තර කරන්න.
iii. ශිෂ්‍යයන්ට රංග අභ්‍යාස වැදගත් වන්නේ කවර හෙයින් දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

03)
i. ගර්භ සංරක්ෂණය මූලික කරගත් පහතරට ප්‍රදේශයේ ප්‍රචලිත ශාන්තිකර්මයක් නම් කරන්න.
ii. එම ශාන්තිකර්මයේ එන නාට්‍යමය ලක්ෂණ ඇතුළත් පෙළපාලි නම් කරන්න.
iii. එම පෙළපාලිමය අවස්ථා වලින් එකක් නාට්‍යමය ලක්ෂණ සහිතව විස්තර කරන්න.

04)
i. අංගරචනය යනු කුමක්ද?
ii. අංගරචනයේ දී මුහුණ බෙදෙන කොටස් නම් කරන්න.
iii. අංගරචනයේ දී භාවිත කරන අංගරචනා ද්‍රව්‍ය 6ක් නම් කර එම අංගරචනා ද්‍රව්‍ය වලින් කෙරෙන කාර්යයන් වෙනවෙනම ලියා දක්වන්න.

05)
i. දෘශ්‍ය මාධ්‍ය දෙකක් හා ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය දෙකක් නම් කරන්න.
ii. චිත්‍රපටයක් සහ වේදිකා නාට්‍යයක් අතර අසමානතා දෙක බැගින් දක්වන්න.
iii. වේදිකා නාට්‍ය කලාවේ දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණ පහක් ලියා ඒ පිළිබඳව විස්තර කරන්න.

06)
i. නාට්‍ය පෙළ යනු කුමක්ද?
ii. නාට්‍ය පෙළක් නිර්මාණය කිරීමේ දී දැකිය හැකි ලක්ෂණ හතරක් ලියන්න.
iii. ඉහත සඳහන් ලක්ෂණ වලින් දෙකක් පිළිබඳව නිදසුන් සහිතව විස්තර කරන්න.

07) පහත දක්වෙන කතා සැකිල්ල ඔබ කැමති පරිදි අවසානයක් කරා ගෙන යමින් නාට්‍ය පෙළක් නිර්මාණය කරන්න.

අසනීප වූ මිතුරකු බැලීමට යෑම සඳහා මිතුරෝ පිරිසක් දුම්රිය නැවතුම්පළට පැමිණෙති. එවිට ම දුම්රිය පිටත්ව යයි. වේදිකාවේ එක් බංකුවක අයිතිකරුවෙකු නොමැති පාර්සලයක් ඇත.

නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය කිරීම (ල 4)
සංවාද හා රංග විධාන සහිතව නාට්‍ය පෙළ රචනය (ල 8)